# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2431/32 - 2025 අප්‍රේල් මස 10 වැනි බ්‍රහස්පතින්දා - 2025.04.10

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## I වැනි කොටස: (I) වැනි ඡේදය - සාමාන්‍ය

### රජයේ නිවේදන

එල්.ඩී.බී. 277/40 (iv)

**(188 වන අධිකාරය වූ) පුරාවස්තු ආඥාපනත**

19 වන වගන්තිය යටතේ වන දැන්වීම

(188 වන අධිකාරය වූ) පුරාවස්තු ආඥාපනතේ කාර්යය සඳහා මේ දැන්වීමෙහි උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති පෞරාණික ස්මාරක "ආරක්ෂිත ස්මාරක" ලෙස ප්‍රකාශයට පත්කරමින් එම ආඥාපනතේ 18 වන වගන්තිය යටතේ නියමයක් කිරීමට අදහස් කරන බවට බුද්ධශාසන, ආගමික සහ සංස්කෘතික කටයුතු අමාත්‍ය හිනිදුම සුනිල් සෙනෙවි වන මා විසින් මෙයින් දැනුම් දෙනු ලැබේ.

ඉහත කී නියමය සිදු කිරීමට එරෙහිව යම් විරෝධතා ඇත්නම්, ඒවා 2025 මැයි මස 07 දින හෝ එදිනට පෙර පුරාවිද්‍යා අධ්‍යක්ෂ ජනරාල්, කොළඹ යන ලිපිනය වෙත එවිය යුතු ය.

සෑම විරෝධතාවයක් ම ලිඛිතව ඉදිරිපත් කළ යුතු අතර, ඒ විරෝධතාව ඉදිරිපත් කරන්නේ කුමන හේතු මත ද යන්න පිළිබඳව ප්‍රකාශයක් එහි අන්තර්ගත විය යුතු ය.

**හිනිදුම සුනිල් සෙනෙවි,**
බුද්ධශාසන, ආගමික සහ
සංස්කෘතික කටයුතු අමාත්‍ය.

2025 පෙබරවාරි මස 28 වැනි දින,
කොළඹ දී ය.


*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

### උපලේඛනය

### *ප්‍රකාශයට පත් කරනු ලැබිය යුතු ආරක්ෂිත ස්මාරක ලේඛනය*

1. සබරගමුව පළාතේ, කෑගල්ල දිස්ත්‍රික්කයේ, රඹුක්කන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, බතමුරේ අංක 10 ඒ ග්‍රාම නිලධාරී වසමට අයත් නවගමුව ග්‍රාමයේ පිහිටි බඩබද්ද නැමති කුඹුරේ ඇති පැරණි ළිං කැට ළිඳ සහ ඒ වටා මීටර් 5ක භූමි පරිශ්‍රය. (උතුරු අක්ෂාංශ $7^{0}$ 309480 හා නැගෙනහිර දේශාංශ $80^{0}$391572)

2. සබරගමුව පළාතේ, කෑගල්ල දිස්ත්‍රික්කයේ, රඹුක්කන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, මීදුම 4 ඊ ග්‍රාම නිලධාරී වසමට අයත් මීදුම මහින්දාරාම විහාර භූමියේ පිහිටි ,-

   (අ) ලෙන් විහාරය සහ එහි සිට උතුරු හා දකුණු දිශාවලින් මීටර් 03 ක් ද නැගෙනහිර හා බටහිර දිශාවලින් මීටර් 5ක් ද වශයෙන් වූ භූමි පරිශ්‍රය;

   (ආ) සිව් දිශාවෙන් මීටර් 02ක වපසරිය සහිත ගල් ආසනය; සහ

   (ඇ) දෙපසට මීටර් 02ක වපසරිය සහිත පියගැට පෙළ (උතුරු අක්ෂාංශ $7^{0}$331140 N හා නැගෙනහිර දේශාංශ $80^{0}$378013 E).

3. සබරගමුව පළාතේ, කෑගල්ල දිස්ත්‍රික්කයේ, රඹුක්කන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, කඩිගමුව 21 ග්‍රාම නිලධාරී වසමට අයත් කඩිගමුව නාගවනාරාම මහා විහාර භූමියේ ඇති පැරණි ප්‍රතිමා ගෘහය, ටැම්පිට විහාර දෙක, සංඝාවාසය, වටදාගෙය, පත්තිනි දේවාලය, ධර්මශාලාව සහ උතුරු දෙසින් සංඝාවාසයේ සිට හා දකුණු දෙසින් පත්තිනි දේවාලයේ සිට මීටර් 02ක් ද නැගෙනහිර දෙසින් ඉහළ ටැම්පිට විහාරයේ සිට හා බටහිර දෙසින් පැරණි ධර්මශාලාවේ සිට මීටර් 5ක් ද වශයෙන් වූ භූමි පරිශ්‍රය (උතුරු අක්ෂාංශ $7^{0}$.31'39.85" N හා නැගෙනහිර දේශාංශ $80^{0}$.42'68.35" E).

4. සබරගමුව පළාතේ, කෑගල්ල දිස්ත්‍රික්කයේ, රඹුක්කන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, දැලිවල 05 ග්‍රාම නිලධාරී වසමට අයත් නුගවෙල ග්‍රාමයේ පිහිටි දේවාලේවත්ත නමින් හඳුන්වන ස්ථානයේ ඇති පත්තිනි දේවාලය හා ඒ වටා සිව් දිශාවෙන් මීටර් 5ක් සහිත වූ භූමි පරිශ්‍රය (උතුරු අක්ෂාංශ $7^{0}$.33521" N හා නැගෙනහිර දේශාංශ $80^{0}$.384336" E).

5. සබරගමුව පළාතේ, කෑගල්ල දිස්ත්‍රික්කයේ, රඹුක්කන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, කුරෙම්පොල 10 බී ග්‍රාම නිලධාරී වසමට අයත් කුරෙම්පොල ග්‍රාමයේ පිහිටි මැදගොඩැල්ල නමින් හඳුන්වන ස්ථානයේ ඇති ටැම්පිට විහාරය සහ ඒ වටා මීටර් 02ක භූමි පරිශ්‍රය (උතුරු අක්ෂාංශ $7^{0}$ 31' 66.61" N හා නැගෙනහිර දේශාංශ $80^{0}$ 38' 39.37" E).

6. මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, යටිනුවර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, මොළදණ්ඩ - 148 ග්‍රාම නිලධාරී වසමට අයත් මොලදණ්ඩ ග්‍රාමයේ පිහිටි කුඹල්වතුමුල්ල පුරාණ විහාර භූමියේ ඇති පුවරු ලිපිය හා ඒ වටා අඩි දෙකක භූමි පරිශ්‍රය.

7. මධ්‍යම පළාතේ, මාතලේ දිස්ත්‍රික්කයේ, ගලේවෙල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, දැඹව ඊ 430 ග්‍රාම නිලධාරී වසමට අයත් දැඹව පුරාණ විහාර භූමියේ ඇති ටැම්පිට විහාරය සහ ඒ වටා අඩි 10ක භූමි පරිශ්‍රය (උතුරු අක්ෂාංශ $7^{0}$.69'43.8" N හා නැගෙනහිර දේශාංශ $80^{0}$ 55' 25.68" E).

8. මධ්‍යම පළාතේ, මාතලේ දිස්ත්‍රික්කයේ, ගලේවෙල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක ඊ 438 සී තෙන්නකෝන්පුර ග්‍රාම නිලධාරී වසමට අයත් තෙන්නකෝන්පුර ග්‍රාමයේ පිහිටි ශ්‍රී ශෛලබිම්බාරාම පුරාණ විහාර භූමියේ ඇති කටාරම් කෙටූ ගල්ලෙන සහ එහි සිට සිව් දිශාවෙන් අඩි 20 බැගින් වූ භූමිපරිශ්‍රය සහ ලෙනට ප්‍රවිෂ්ටවීම සඳහා අඩි 6ක් පළලින් යුතු වූ මාර්ගය (උතුරු අක්ෂාංශ $7^{0}$ 82' 58" N හා නැගෙනහිර දේශාංශ $80^{0}$ 62' 21.11" E).

9. දකුණු පළාතේ, ගාල්ල දිස්ත්‍රික්කයේ, හික්කඩුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ගම්මඩුවවත්ත 53 ඒ ග්‍රාම නිලධාරී වසමට අයත් දොඩන්දූව (ගම්මඩුවවත්ත) ග්‍රාමයේ පිහිටි කුමාර මහ විහාර භූමියේ ඇති පැරණි ධර්මශාලාව සහ සණ්ඨාර කුලුන (උතුරු අක්ෂාංශ $6^{0}$ 06' 44.95" N හා නැගෙනහිර දේශාංශ $80^{0}$ 07' 29.65" E).

10. දකුණු පළාතේ, මාතර දිස්ත්‍රික්කයේ, තිහගොඩ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, වටගෙදර අංක 337/ඒ ග්‍රාම නිලධාරී වසමට අයත් වටගෙදර ශ්‍රී සුධර්මාරාම පුරාණ පොත්ගුල් විහාර භූමියේ ඇති ටැම්පිට ප්‍රතිමා ගෘහය සහ ඒ වටා අඩි 5 බැගින් වූ භූමි පරිශ්‍රය (උතුරු අක්ෂාංශ $5^{0}$59' 25.1" N හා නැගෙනහිර දේශාංශ $80^{0}$ 32' 21.5" E).

11. දකුණු පළාතේ, හම්බන්තොට දිස්ත්‍රික්කයේ, අඟුණකොළපැලැස්ස ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අමරතුංගම අංක 222 ග්‍රාම නිලධාරි වසමට අයත් අමරතුංගම පුරාණ විහාර භූමියේ ඇති චෛත්‍ය ගොඩැල්ල සහ ඒ වටා මීටර් 50ක භූමි පරිශ්‍රය ද ගොඩනැගිලි නටබුන් හා ඒ වටා මීටර් 5ක භූමි පරිශ්‍රය.

12. දකුණු පළාතේ, හම්බන්තොට දිස්ත්‍රික්කයේ, අඟුණකොළපැලැස්ස ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ජඳුර 197 ග්‍රාම නිලධාරි වසමට අයත් ජඳුර ග්‍රාමයේ පිහිටි වෙලගත්වල පුරාණ රජමහා විහාර භූමියේ ඇති චෛත්‍ය ගොඩැල්ල සහ ඒ වටා මීටර් 50ක භූමි පරිශ්‍රය (උතුරු අක්ෂාංශ $6^0$ 9' 5" N හා නැගෙනහිර දේශාංශ $80^0$ 53' 22" E).

13. දකුණු පළාතේ, හම්බන්තොට දිස්ත්‍රික්කයේ, අඟුණකොළපැලැස්ස ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, උස්වැට 225 ග්‍රාම නිලධාරි වසමට අයත් උස්වැව මිලක්ඛතිස්ස රජමහා විහාර භූමියේ ඇති චෛත්‍ය ගොඩැල්ල සහ ඒ වටා මීටර් 50ක භූමි පරිශ්‍රය (උතුරු අක්ෂාංශ $6^0$ 14' 46" N හා නැගෙනහිර දේශාංශ $80^0$ 51' 58" E).

14. දකුණු පළාතේ, ගාල්ල දිස්ත්‍රික්කයේ, යක්කලමුල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, බඳුන්ගල 181 සී ග්‍රාම නිලධාරි වසමට අයත් වල්පොල ග්‍රාමයේ පිංගොඩවත්ත නමින් හඳුන්වන ඉඩමේ ඇති පැරණි නිවස හා ඒ වටා මීටර් 1.5ක භූමි පරිශ්‍රය.

15. ඌව පළාතේ, බදුල්ල දිස්ත්‍රික්කයේ, හල්දුම්මුල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, වැළිජිය 157 - සී ග්‍රාම නිලධාරි වසමට අයත් බෝගන්දන ග්‍රාමයේ පිහිටි බෝගන්දන විහාර භූමියේ ඇති පැරණි ස්තූප ගොඩැල්ල සහ ඒ වටා සිව්දිශාවට මීටර් 10ක් බැගින් වූ භූමි පරිශ්‍රය (උතුරු අක්ෂාංශ $6^0$ 42' 56.3" N හා නැගෙනහිර දේශාංශ $80^0$ 52' 19.6" E).

16. ඌව පළාතේ, බදුල්ල දිස්ත්‍රික්කයේ, හල්දුම්මුල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 156 කිරවනාගම ග්‍රාම නිලධාරි වසමට අයත් කිරවනාගම මාතිකාරාම විහාර භූමියේ ඇති පැරණි ආවාස ගෙය, ප්‍රතිමා ගෘහය සහ එම එක් එක් ස්මාරක වටා මීටර් 05ක් බැගින් වූ භූමි පරිශ්‍රය (උතුරු අක්ෂාංශ $6^0$ 44' 16.31" N හා නැගෙනහිර දේශාංශ $80^0$ 55' 55.41" E).

EOG 04 - 0025

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.